**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව.**

**පුත්තලම දිස්ත්‍රික්කය**

---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 17 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 10 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කරුවලගස්වැව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරික්ෂණ කරනු ලැබේ.

(අ) සාලියවැව පොළ භූමියෙන් ඉවත් කරන ලද ගොඩනැඟිලි ද්‍රව්‍යවල වටිනාකම සහ 2013 දෙසැම්බර් 31 දිනට අන්තර් සම්බන්ධිත ගල් නිෂ්පාදනයේ ඉතිරි තොග ශේෂය වූ රු.249,764 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 4 ක දී ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් රු.328,268 ක් අයභාර වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ) රු.309,996ක නිමි වැඩ වටිනාකමකින් යුක්ත වූ කුට්ටිගල් නිෂ්පාදනාගාරය රු.399,996 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.90,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) රු.338,900 ක් වටිනා අංක RW – 8952 දරන ට්‍රේලරයේ වටිනාකම රු.200,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මෝටර් රථ හා කරත්තවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.138,900 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) හිඟ ජල බදු ශේෂය රු.139,780 ක් වැඩියෙන් දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ ආදායම් ණයගැතියන් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල 2013 දෙසැම්බර් 31 දිනට විථි ලාම්පු උපකරණ ශේෂය රු.14,642 ක්ද, අන්තර් සම්බන්ධිත කුට්ටිගල් විකිණීමෙන් ලැබිය යුතු මුදල රු.32,980 ක්ද වැඩියෙන් දක්වා තිබූ අතර, ගබඩා තොග ශේෂය රු.6,484 ක්ද, හිඟ නල ළිං ගාස්තු රු.230,253 ක් ද අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>ලැබිය යුතු ගිණුම්</u>

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.16,622,489 ක් වූ අතර, එයින් වර්ෂ 03 කට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.82,376 ක් විය.

1.3.3 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.12,876,269 ක් වූ අතර, එයින් වර්ෂ 01 කට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.3,950,605 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

---------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 32,594,779 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,245,205 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,146,077 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායයම්**

සමාලෝචිත වර්ෂයට අදාළව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (අ) | වරිපනම් හා බදු | 200 | 149 | 51 |
| (ආ) | කුලී | 634 | 631 | 3 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 595 | 521 | 74 |
| (ඈ) | සේවා සඳහා ගාස්තු | 657 | 1,163 | (506) |
| (ඉ) | වරෙන්තු හා දඩ | 3,530 | 1,463 | 2,067 |
| (ඊ) | වෙනත් ආදායම් | 1,078 | 112 | 966 |

2.3 **මුද්දර ගාස්තු**

2013 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබූ අතර, වර්ෂය සඳහා වන අභ්‍යන්තර බිල් කිරීම් රු.793,000 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

**3.1 කාර්ය සාධන ඇගයීම**

2013 වර්ෂයේ දී වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් පළාත් පාලන ආයතන අතර සිදුකර තිබූ කාර්ය සාධන ඇගයීමට අනුව පුස්තකාලය, පෙර පාසල්, කර්මාන්ත සහ දත්ත පද්ධතිය යන අංශවල පමණක් ප්‍රගතියක් පෙන්නුම් කරන බවට වාර්තා වී තිබුණ ද, ආයුර්වේද,

සතිපොල සහ අපද්‍රව්‍ය, වාර්ෂික සැලසුම්, ළමා උද්‍යාන සහ පවිත්‍ර නගරය යන අනෙකුත් අංශයන්හි ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි. 2013 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉපලෝගම ජල ව්‍යාපෘතිය සඳහා ජල නල උපාංග සහ අනෙකුත් ජල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.57,765ක මුදලක් වැය කර තිබුණු අතර, අදාළ මිලදී ගැනීම් මිල ගණන් කැඳවීමකින් තොරව සිදුකර තිබුණි.

(ආ) ඉපලෝගම ජල ව්‍යාපෘතිය සම්බන්ධ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට හිඟ ජල බදු ශේෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සභාවේ වාහන 07ක් වෙනුවෙන් 2013 වර්ෂය තුල දී ඉන්ධන ලීටර් 8606 ක ප්‍රමාණයක් ලබාගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් රු.1,089,513 ක මුදලක් වැයකර තිබුණි. සභාවෙහි ඉන්ධන සඳහා වැය වූ මුදල මුළු පුනරාවර්තන වියදම්වලින් සියයට 6 ක අගයක් ගෙන තිබුණි.

## 3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක WP LE – 7454 දරන මහේන්ද්‍රා සිංගල් කැබ් රථය, අංක 49-2271 සහ 46-5800 දරන ට්‍රැක්ටරය හා ට්‍රේලරය සහ අංක 49-1999 දරන රෝද හතරේ මිනි ට්‍රැක්ටරය දීර්ඝ කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව සභා භූමිය තුළ රඳවා තිබූ නමුත්, අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා භූමිය තුළ වූ ලිපිකරු නිල නිවාසය කිසිදු ප්‍රයෝජනයක් නොගෙන දිගු කාලයක් තිස්සේ නිකරුණේ පැවත තිබුණි.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 17 කණුව සාගිනි වැව අන්තර් සම්බන්ධිත ගල් ඇතුරු මාර්ගයෙහි වැඩ කටයුතු රු.444,781 ක නිමි වැඩ වටිනාකමකින් යුතුව 2013 දෙසැම්බර් 07 දින නිමකර තිබුණි. 2014 ජනවාරි 30 දින සිදු කරන ලද ක්ෂේත්‍ර විගණන පරීක්ෂණ අවස්ථාව වන විට එම මාර්ගයේ ඉදිරිපස ඇති කොන්ක්‍රීට් බැම්මද, මාර්ගයේ කෙලවර දමා තිබූ කොන්ක්‍රීට් බැමි සහ මාර්ගයේ වම් පස කොන්ක්‍රීට් බැමිද පුපුරා ගොස් තිබුණි. තවද, මාර්ගයේ ආරම්භයේ තැන තැන ගල් අතුරා නොතිබුණි.

(ආ) රු.449,961 ක නිමි වැඩ වටිනාකමකින් යුතුව 2013 නොවැම්බර් 19 දින වැඩ නිමකර තිබූ විද්‍යා චක්‍රවර්ති පාසැල් මාවත දෙපස බොරළු දමා තලා නොතිබූ බව 2014 ජනවාරි 30 දින සිදු කරන ලද ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එසේම මාර්ගයේ ඉදිරිපස ඉදිකර තිබූ කොන්ක්‍රීට් බැම්ම ද කැඩී තිබුණි.

(ඇ) මඟ නැඟුම අරමුදලේ ප්‍රතිපාදන මත රු.443,583ක් වැයකර ඉදිකරන ලද ගලවැව පාසල අසලින් රාජාංගනය යාය 06 පාර දක්වා දිවෙන අන්තර් සම්බන්ධිත ගල් ඇතුරු මාර්ගය 2014 ජනවාරි 30 දින සිදු කරන ලද ක්ෂේත්‍ර විගණන පරීක්ෂණයේදී මාර්ගයේ කෙලවර සහ ඉදිරිපස කොන්ක්‍රීට් බැම්ම කැඩී ගොස් තිබූ බව නිරීක්ෂණය විය. මෙම මාර්ගයෙහි දිග අඩි 279 ක් දුරට මාර්ගය දෙපසට රුඳවුම් බැමි සකස් කර තිබුණි. පසුව සැලැස්ම වෙනස් කරමින් මාර්ගයේ ඉදිරිපස පළල් කිරීම නිසා මාර්ගය ආරම්භයේ සිට දිග අඩි 279 ක් දක්වා රුදවුම් බැමි කොන්ක්‍රීට් කර තිබුණද, එයින් අඩි 46 ක ප්‍රමාණයක් නිකරුණේ පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තු ප්‍රකාරව වැඩ නිම කර නොතිබුණි.

(ඈ) අන්තර් සම්බන්ධිත ගල් අතුරන ලද මාර්ග සියල්ලෙහිම පාරේ දෙපස තැන් තැන් වල කුට්ටිගල් අල්ලා නොතිබුණු අඟල් 3.5ක පමණ තීරුවක් ගල් කුඩු දමා වසා තිබුණු බව නිරීක්ෂණය විය.

**4. පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) කොන්ත්‍රාත් පාලනය

(ඈ) වාහන පාලනය